01/11 2024 03:05 PM FAX
RECEIVED 01/11/2024 14:52
SRI LANKA CUSTOMS
I4331
01 NOV 2024
ICT Directorate
RECEIVED
01 NOV 2024
S.L. Customs
P.P.& R. Division
2456

**Government Notification**
**Special Commodity Levy Act, No. 48 of 2007**
**Order under Section 2**

By virtue of the powers vested in me under Section 2 of the Special Commodity Levy Act No. 48 of 2007, I, Anura Kumara Dissanayake, Minister of Finance, Economic Development, Policy Formulation, Planning and Tourism of the Democratic Socialist Republic of Sri Lanka, do hereby order to charge the Special Commodity Levy in respect of the commodities specified in Column I of the Schedule hereto at the rates specified in the corresponding entry in the Column II of that Schedule for a period from November 02, 2024 to December 31, 2024 as the validity period of one year of the existing Order, published in the Gazette Notification No. 2356/20 dated November 01, 2023 is expired on November 01, 2024.

**SCHEDULE**

| Column I Commodity Item | | | | Column II Special Commodity Levy |
|---|---|---|---|---|
| | **H. S. Heading** | **H.S. Code** | **Description** | |
| 1 | 17.01 | | Cane or beet sugar and chemically pure sucrose, in solid form | |
| | | | Other : | |
| | | 1701.91 | Containing added flavouring or colouring matter | |
| | | 1701.91.10 | Having polarimeter reading more than or equal to $99.7^0$ | Rs.50 per Kg |
| | | 1701.91.20 | Having polarimeter reading of more than or equal to $99.5^0$ and less than $99.7^0$ | Rs.50 per Kg |
| | | 1701.99 | Other : | |
| | | 1701.99.10 | Cane sugar having polarimeter reading of more than or equal to $99.7^0$ | Rs.50 per Kg |
| | | 1701.99.20 | Cane sugar having polarimeter reading of more than or equal to $99.5^0$ and less than $99.7^0$ | Rs.50 per Kg |
| | | 1701.99.30 | Beet sugar having polarimeter reading of more than or equal to $99.7^0$ | Rs.50 per Kg |
| | | 1701.99.40 | Beet sugar having polarimeter reading of more than or equal to $99.5^0$ and less than $99.7^0$ | Rs.50 per Kg |
| | | 1701.99.90 | Other : | Rs.50 per Kg |

This Order shall be valid subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

**Anura Kumara Dissanayake**
**Minister of Finance, Economic Development, Policy Formulation, Planning and Tourism**

November 01, 2024,
Ministry of Finance, Economic Development, Policy Formulation, Planning and Tourism,
Colombo 01.

024 03:05 PM FAX
RECEIVED 01/11/2024 14:52
0003


# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
# வியாபார மற்றும் முதலீட்டுக் கொள்கைத் திணைக்களம்
# Department of Trade and Investment Policy

මහලේකම් කාර්යාලය, කොළඹ - 01
செயலகம், கொழும்பு - 01
The Secretariat, Colombo - 01

මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
நிதி பொருளாதார அபிவிருத்தி , கொள்கை வகுத்தல், திட்டமிடல் மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
Ministry of Finance, Economic Development, Policy Formulation, Planning & Tourism


මගේ අංකය / எனது இல. / My No. TIP/TP/01/10/218

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2024.11.01

රජයේ මුද්‍රණාලයාධිපති
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

මහත්මියණි

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්ති යටතේ වන ගැසට් නිවේදනය**

මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය අමාත්‍යතුමා විසින් 2024
නොවැම්බර් මස 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ
භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය යටතේ වන ගැසට් නිවේදනය **2024.11.01** දිනැති අංක **2408/15** දරන
අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සකස් කර මේ
සමග එවමි.

මෙම නිවේදනයේ සෝදුපත් කියවීම සඳහා කොළඹ 01, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති
දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමතනු මැනවි (කාර්යාලයීය දුරකථන අංකය 2484930 වේ).

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල කිරීමෙන් පසුව ඉන් පිටපත් 400 ක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති
දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතද, පිටපත් 25 ක් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙතද එවනු මැනවි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ විධි විධාන අනුව මෙම ගැසට් නිවේදනය අප්‍රමාදව
පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුව ඇති බැවින්, මුද්‍රිත පිටපත් ඉතා ඉක්මනින් මා
වෙත ලැබෙන්නට සලස්වන්නේ නම් කෘතඥ වෙමි.

මෙයට - විශ්වාසී

**කේ. ඒ. විමලේන්තිරරාජා**
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්** -

- ලේකම්, වෙළඳ, වානිජ, ආහාර සුරක්ෂිතතා, සමුපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
- ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශ
- රේගු අධ්‍යක්ෂ ජනරාල්, මේ සමග එවනු ලබන 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වන වගන්තිය යටතේ වන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ අවශ්‍ය කටයුතු සඳහා
- අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව - *වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දැනුවත් කිරීම සඳහා*
- අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව- වෙබ් පිටුවේ පළකිරීම සඳහා

# රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, 2023 නොවැම්බර් මස 01 දිනැති අංක 2356/20 දරන ගැසට් නිවේදනයේ සඳහන් වසරක් වූ වලංගු කාලය 2024 නොවැම්බර් මස 01 දිනයෙන් අවසන් වීම මත, මෙහි පහත උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත මෙතෙක් පැවති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, 2024 නොවැම්බර් මස 02 වැනි දින සිට 2024 දෙසැම්බර් මස 31 දින දක්වා වූ කාල සීමාවක් සඳහා පවත්වාගෙන යාමට මෙයින් නියම කරමි.

### උපලේඛනය

| (I) වන තීරය | | | | (II) වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 01 | 17.01 | | ඝන තත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | අනෙකුත් : | |
| | | 1701.91 | එකතුකරන ලද රසකාරක හෝ වර්ණක අඩංගු: | |
| | | 1701.91.10 | පොලරීමීටරයේ $99.7^{0}$ ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.91.20 | පොලරීමීටරයේ $99.5^{0}$ ට වැඩි හෝ සමාන සහ $99.7^{0}$ ට අඩු සංඛ්‍යාත සහිත | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99 | අනෙකුත් : | |
| | | 1701.99.10 | පොලරීමීටරයේ $99.7^{0}$ ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත උක් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.20 | පොලරීමීටරයේ $99.5^{0}$ ට වැඩි හෝ සමාන සහ $99.7^{0}$ ට අඩු සංඛ්‍යාත සහිත උක් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.30 | පොලරීමීටරයේ $99.7^{0}$ ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත බීට් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.40 | පොලරීමීටරයේ $99.5^{0}$ ට වැඩි හෝ සමාන සහ $99.7^{0}$ ට අඩු සංඛ්‍යාත සහිත බීට් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.90 | අනෙකුත් : | කි. ග්‍රෑමයට රු. 50 |

මෙම නියමය, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

අනුර කුමාර දිසානායක
**මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති**
**සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය**

2024 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති
සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ දී ය.